# කුඹල් කර්මාන්තකරුවන් තම නිෂ්පාදන අමුද්‍රව්‍යය ලබා ගැනීමේදී සහ නිෂ්පාදන විකිණීමේදී මතුවන ගැටලු පිළිබඳ විමර්ශනයක් (හම්බන්තොට කොහොම් පෝරුව ප්‍රදේශය ඇසුරින්)

*ඒ.යූ. හෙට්ටිආරච්චි [1], එම්.ආර්.එම්. උෂාන් [2], කේ.පී.සී.ජේ. ලාලිත්‍යා [3], ඩී.එම්.ඒ.ඩී. දිසානායක [4]*

ලොව පළමුවෙන්ම මැටි බඳුන් නිෂ්පාදනය කිරීම නව ශිලා යුගයේදී ආරම්භ වන්නට ඇත. ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගයේ පටන් වසර 9000කට ඇත අතීතයකට කුඹල් කර්මාන්තය දිව යන බව විද්වතුන්ගේ අදහසයි. වර්තමානයේ මෙම කුඹල් නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීමේ ගැටලුකාරී තත්ත්වයක් පවතී. එබැවින් මෙම පර්යේෂණයේ වැදගත්කම දෛනිකව වැඩිවෙමින් පවතී. මෙම පර්යේෂණය තුළින් ද කුඹල් කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීමේදී මතුවන ගැටලුකාරී තත්වයන් සහ කුඹල් නිෂ්පාදනය භාණ්ඩ සඳහා එය බලපාන්නේ කෙසේද යන්න පිළිබඳව විමර්ශනය කරයි. මෙම අමුද්‍රව්‍ය ලබා ගැනීමට එල්ලවන අභියෝග නිෂ්පාදන සඳහා කුමන ආකාරයෙන් බලපානවාද? සමාජය තුළ මැටිකර්මාන්තකරුවන් සඳහා එල්ල වී පවතින තත්ත්වය සාධාරණද? මෙය පර්යේෂණයේ ප්‍රධාන ගැටලු වේ. මෙම පර්යේෂණය ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රමවේදයන් යටතේ මිශ්‍ර ක්‍රමවේදය ඔස්සේ සිදු විය. අධ්‍යයන ප්‍රදේශය ලෙස හම්බන්තොට දිස්ත්‍රික්කයේ කොහොම්පොරුව ප්‍රදේශයේ කුඹල් පවුල් 330 ක් යොදාගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා සහ මාර්ග ගත ප්‍රශ්නාවලි තුළින් දත්ත රැස් කිරීම සිදුකල අතර රැස් කරන ලද තොරතුරු සවිස්තරාත්මක ලෙස සංඛ්‍යා විශ්ලේෂණ ක්‍රමවේදයට අනුව සිදුකරන ලදී. සම්මුඛ සාකච්ඡා මගින් ලබාගන්නා ලද තොරතුරු ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය යටතේ දත්ත සැලසුම්කර සංක්ෂිප්ත කර තේමාවන් ඔස්සේ ඉදිරිපත් කරන ලදී. ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස පවතින දර,මැටි යන අමුමුද්‍රව්‍ය ලබා ගැනීමේදී රජය විසින් මැටි කැපීමට සහ දර ලබා ගැනීමට රජය විසින් පනවා ඇති නීති රීති රෙගුලාසි ද, දර ලබාගැනීමට ප්‍රදේශයේ භූමියේ පවතින අවකාශයේ අඩුපාඩුව ද ගම්‍යමාන විය. වෙළෙඳපොළ මිල කරණය හමුවේ තම ශ්‍රමයට සරිලන විකුණුම් මිලක් නොමැති වීම ප්‍රධාන වශයෙන් හඳුනාගැනීමට හැකිවිය. ඇලුමිනියම් භාණ්ඩ ආදේශක භාණ්ඩ ලෙස පැවතීම මැටි නිශ්පාදන විකිණීමට බාධාවක් ලෙස හඳුනා ගන්නා ලදී. ශ්‍රම ගැටළු තුළදී තරුණ, තරුණියන් නාගරීකරණය වීමත් පාරම්පරික තම රැකියාවෙන් ඔබ්බට ගොස් වෙනත් රැකියාවල නිරත වීම නිසා ශ්‍රමයද ලබාගැනීමට අපහසු බව තහවුරු විය. නිෂ්පාදන අමුද්‍රව්‍යය ලබා ගැනීමේදී සහ නිෂ්පාදිත භාණ්ඩ විකිණීමේදී මතුවන ගැටලු අවම කර ගනිමින් කුඹල් නිෂ්පාදන තවදුරටත් ලංකාව තුළ ව්‍යාප්ත කිරීමට රජය විසින් නියමිත මිල ගණන්ද, වෙළඳපොළ තුළ නියමිත වූ ස්ථානයක්ද, කර්මාන්තකරුවන් හට ප්‍රායෝගික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සාධාරණ කොට කර ගනිමින් පර්යේෂණය නිමාව දැකගත හැකිය.

***ප්‍රමුඛ පදඃ*** අමුද්‍රව්‍ය, අභියෝගතා, කුඹල්, තාක්ෂණය, විකුණුම් මිල

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. uhapsara@gmail.com
[2] ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. ushanu450@gmail.com
[3] රුහුණ විශ්වවිද්‍යාලය. chathulalithya@gmail.com
[4] රුහුණ විශ්වවිද්‍යාලය. dulanjani2020cp@gmail.com